## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

# තනතුරු පුරප්පාඩු

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

තනතුර : **ජල තත්ත්ව නිලධාරී (II වන ශ්‍රේණිය)**

**සේවා ගණය** : කණිෂ්ඨ කළමනාකාර (JM 1-1 සේවා ගණය)

**වැටුප් පරිමාණය** : රු 42,600 - 10 X 755 - 18 X 1,135 = 70,580/-

**සුදුසුකම් (පහත සුදුසුකම් 1 හෝ 2 හෝ 3 හෝ 4)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් රසායන විද්‍යා විෂයය සහිතව විද්‍යා විෂයය ක්ෂේත්‍රයේ උපාධියක් ලබා තිබීම.

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q) හත්වැනි (07) මට්ටමට නොඅඩු මට්ටමක අදාළ විෂයය ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කසලතාවන්හි (N.V.Q) හයවැනි (06) මට්ටමට නොඅඩු මට්ටමක අදාළ විෂයය ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

4. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන් (N.V.Q) පස්වැනි (05) මට්ටමට නොඅඩු මට්ටමක අදාළ විෂයය ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

   සහ

   සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස** : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතු ය.

**බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත තරග විභාගයක් හා /හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්**

තනතුරු :
1. **ජල තත්ත්ව සහකාර (III වන ශ්‍රේණිය)**
2. **ඉංජිනේරු සහකාර (සිවිල්) (III වන ශ්‍රේණිය)**
3. **කාර්මික සහකාර (III වන ශ්‍රේණිය)**
4. **ජල විද්‍යා සහකාර (III වන ශ්‍රේණිය)**
5. **සැලසුම් ශිල්පී (III වන ශ්‍රේණිය)**

**සේවා ගණය** : කළමනාකරණ සහකාර (තාක්ෂණ) (MA 2-2 සේවා ගණය)

**වැටුප් පරිමාණය** : රු 30,310 - 10 X 300 -7 X 350 -4 X 600 - 20 ×710 = 52.360/-

**සුදුසුකම්** : එක් එක් තනතුරෙහි කාර්යය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත්තා ලද කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (N.V.Q)පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස** : අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය :** ලිඛිත තරග විභාගයක් හා/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

තමා විසින් සකස් කර ගත් ජීවදත්ත පත්‍රිකාවක් 2020.07.10 වන දිනට හෝ එදිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී.බී. ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් යොමු කළ යුතුව ඇත.

අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු අතර, නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදු වන බවද දන්වමි. අයදුම්පත සමග අධ්‍යාපන/ වෘත්තීය සහතික වල පිටපත් අමුණා එවිය යුතු අතර, එම සහතික වල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයවළුන් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

මෙම කටයුතු සම්බන්ධව අවසන් තීරණය ගැනීම අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු බවද දන්වමි.

**සැයු :** අයදුම්පත් භාර ගන්නා අවසන් වන දිනය වන විට ඒ ඒ තනතුරට අදාළ සුදුසුකම් සපුරා තිබිය යුතු බව කාරුණිකව සළකන්න.

තවද 2019.09.06 වන දින දිනමිණ පුවත්පතෙහි පළ කරන ලද කාර්මික සහකාර තනතුරට අදාළ ඉල්ලුම්පත් කැඳවීම මෙයින් අවලංගු කරන බව කාරුණිකව සළකන්න.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.**